# POLITICAL IDEOLOGIES

# (Part IV)

# සමාජ ප්‍රජාතන්ත්‍රවාදය

මෙය දහනව වන සියවසේ අග භාගයේ දී ආරම්භ වූ වර්තමානයේත් පවත්නා මතවාදයකි.

1860 දශකයේ ජර්මනියේ කම්කරු පන්ති ව්‍යාපාරය පදනම් කොටගෙන බිහි වූ ජර්මන් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය මෙහි ලා පුරෝගාමී විය.

වෘත්තීය සමිතිවල සංවිධානය වූ යුරෝපීය රටවල කම්කරු පන්තිය පදනම් කොටගෙන සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ බිහි වී ඇති ආකාරය 20 සියවසේ මුල් දශකවල දැකිය හැකි විය.

දෙවන ලෝක යුද්ධයෙන් පසු ජර්මනියේ හා ස්කැන්ඩිනේවියානු රටවල සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරවලට නව පුනර්ජීවයක් ලැබිණ.

ClassWork.LK

විසි වැනි සියවසේ යුරෝපීය සමාජ ප්‍රජාතන්ත්‍රවාදී චින්තනයේ ප්‍රධානතම ලක්ෂණය නම් ලිබරල්වාදය සහ මාක්ස්වාදය යන චින්තන ධාරා එකක් අනෙක සමඟ අනන්‍ය නොවී, ඒවායේ සමහර අංග මිශ්‍ර කර ගොඩනැගුණු එකක් වීම ය. ධනවාදයේ සහ මාක්ස්වාදයේ සම්මිශ්‍රණයක් ලෙස ද මෙය හඳුන්වන්නේ එබැවිනි.

සමාජ ප්‍රජාතන්ත්‍රවාදය යුරෝපයේ ආරම්භ වූයේ මාක්ස්වාදයේ ආභාසය ලබමින් සහ එය තම නිල මතවාදය ලෙස සලකමිනි. එම සමාජ ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂ මුලදී මාක්ස්වාදයේ ආභාසය ලැබූ ඒවා ය.

විසි වැනි සියවසේ මුල් දශකයේ, සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යවහාරයට මාක්ස්වාදයෙන් හා විප්ලවීය සමාජවාදයෙන් වෙනස් වූ මතවාදී නැඹුරුවක් හා දේශපාලන අනන්‍යතාවයක් ලැබෙන්නට විය. එහි පුරෝගාමියා ද මෙම චින්තනය හැඩගැස්වූ ප්‍රධානතම චින්තකයා ද (1850-1932) ජර්මන් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ නායක එඩ්වර්ඩ් බර්න්ස්ටයින් (Edward Bernstein) ය.

ClassWork.LK

මුල දී මාක්ස්වාදියකු වූ ඔහු, අනිවාර්ය කම්කරු පන්ති විප්ලවයක් පිළිබඳ ව අදහස පිළිගත්තේ නැත. පාර්ලිමේන්තුව මාධ්‍ය කොටගෙන, ප්‍රතිසංස්කරණ මඟින් කම්කරු පන්තියට සමාජවාදී අරමුණු ඉටු කරගත හැකි ය, යන නව අදහස සමාජ ප්‍රජාතන්ත්‍රවාදී චින්තනයට එක් කිරීම බර්න්ස්ටයින් ඊට කළ එකතුව විය.

1930 දශකයෙන් පසු ව රාජ්‍ය සුභසාධනවාදී මතවාදය, සමාජ ප්‍රජාතන්ත්‍රවාදී චින්තනය සමඟ එක්විය. සමාජ ප්‍රජාතන්ත්‍රවාදය සමාජවාදයේ ම මෘදු ධාරාවක් ලෙස සැලකීමට පසුබිම් වූයේ මෙම චින්තනමය එකතුව යි.

දේශපාලන චින්තනයක් ලෙස සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රධාන මූලධර්ම මෙසේ ය.

i. ධනවාදී සමාජ ආර්ථික ක්‍රමය විසින් ඇති කරනු ලබන ගැඹුරු ආර්ථික අසමානතා, දරිද්‍රතාව සහ සමාජ අසාධාරණයන්ට විසඳුම් ධනවාදය තුළ නොමැති නිසා එම ක්‍රමය ප්‍රතික්ෂේප කළ යුතු ය.

ClassWork.LK

ii. ධනවාදයට විකල්පය ලෙස මතු වූ සමාජවාදය, ධනවාදය විසින් ඇති කරන ලද ගැටලු වලට ප්‍රබල පිළිතුරු යෝජනා කළේය. එහෙත් විප්ලවීය පරිවර්තනයක් වෙතින් සමාජවාදය බිහි කිරීමේ මාක්ස්වාදී පිළිවෙත ප්‍රායෝගිකත්වයෙන් දුරස් වේ.

iii. ධනවාදයේ ගැටලුවලට සමාජවාදී විසඳුම් ලබා දිය යුත්තේ ධනවාදී ක්‍රමය, සමාජ සමානාත්මතාව හා සමාජ සාධාරණත්වය පිළිබඳ සමාජවාදී මූලධර්ම අනුව ප්‍රතිසංස්කරණය කිරීමෙනි.

iv. ධනවාදය සමාජවාදී මූලධර්ම අනුව ප්‍රතිසංස්කරණය කිරීමේ ප්‍රතිපත්තිමය පියවර පහත සඳහන් පරිදි වේ.

ClassWork.LK

## ආර්ථික ක්ෂේත්‍රයට රාජ්‍යය මැදිහත් වීම

මෙය රාජ්‍ය නිර්බාධවාදී ලිබරල් ධනවාදී මූලධර්මයෙන් පැහැදිලි ව වෙන් වීමකි.

රාජ්‍යයේ මැදිහත් වීම මඟින් ආර්ථිකයේ ගමන් මඟ පාලනය කිරීමට හා හැසිරවීමට හැකි වේ.

එමඟින් වෙළෙඳපොළ ආර්ථිකයෙන් ඇති වන අයහපත් ආර්ථික-සමාජ ප්‍රතිඵල (සමාජ අසමානතා, දරිද්‍රතාව, සමජ අසාධාරණත්වය ආදිය) සඳහා පිළියම් යෙදිය හැකි ය.

## මිශ්‍ර ආර්ථිකය

මේ මඟින් යෝජනා වූයේ ධනවාදී හා සමාජවාදී ආර්ථික මූලධර්ම හා ප්‍රතිපත්ති සංයෝග කිරීම යි.

වෙළෙඳපොළ ආර්ථිකය පවත්නා ගමන් ම එකී ආර්ථිකය රාජ්‍යය විසින් පාලනය කිරීම මිශ්‍ර ආර්ථිකයේ (Mixed Economy) ප්‍රධාන ලක්ෂණය යි.

ClassWork.LK

## සමාජ සුභසාධනය

ධනවාදී ලිබරල් ආර්ථික ක්‍රමයේ සමාජ සුභසාධනය යන සංකල්පය පවතින්නේ ම නැත.

එහි විශ්වාසය වූයේ වෙළෙඳපොළ බලවේග විසින් සමාජ සුභ සාධනය ''බලගන්වා ඇති '' බව යි.

සමාජ ප්‍රජාතන්ත්‍රවාදය එම අදහස තරයේ ම ප්‍රතික්ෂේප කරමින්, නිදහස් වෙළෙඳපොළට කළ හැක්කේ අසමානතාව ඇති කිරීම මිස, ඒවාට විසඳුම් යෙදීම නොවන බව අවධාරණය කරයි.

එයට පිළියම් වශයෙන් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී චින්තනය යෝජනා කළේ ආර්ථික හා සමාජ ක්ෂේත්‍රවල රජයේ සෘජු මැදිහත්වීම මත පදනම් වූ සමාජ සුභසාධනය(Social Welfarism) ය.

Class Work.LK

## ආදායම් සහ ධනය සමාජයේ යළි බෙදාහැරීම

ධනවාදී වෙළෙඳපළ ආර්ථිකයේ අයහපත් ප්‍රතිපලයක් වන ආදායම් හා ධනය බෙදීයාමේ දැඩි අසමානතා සිදුවීම සහ ධනය සුළුතරයක් අත කේන්ද්‍රගත වීම යන්නට සමාජ ප්‍රජාතන්ත්‍රවාදය යෝජනා කළේ ආදායම් සහ ධනය යළි බෙදා හැරීමේ විකල්පය යි. (Redistribution of income and wealth)

ආදායම් බදු මඟින් ධනවතුන්ගෙන් ලබා ගන්නා ධනය සමාජ සුභසාධන ක්‍රියාමාර්ග සඳහා වැය කිරීම මේ සඳහා යොදාගෙන ඇති ප්‍රධාන උපක්‍රමය යි.

## සාමූහික කේවල් කිරීම

සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරය, ඓතිහාසික වශයෙන් කම්කරු පන්තිය මත පදනම් වූවකි.

එබැවින් කම්කරු පන්තියේ වැටුප් සහ ජීවන මට්ටම් ආරක්ෂා කර ගැනීම අරමුණු කරගෙන ස්වාමි පක්ෂය සමඟ සාමූහික ගිවිසුම්වලට එළඹීම පිළිබඳ මූලධර්මය සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික ලක්ෂණයක් වේ.

ClassWork.LK

ClassWork.LK